# 2.1 නිරීක්ෂණ සහ යෝජනා

# 2.2 සංඛ්‍යාලේඛන

## 2.1.1 නිරීක්ෂණ

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත හා එයට අදාල සංශෝධිත පනත් මගින් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ඔම්බුඩ්ස්මන්වරයාගේ විෂය පථය තුලට ගැනෙන පැමිණිලි විමර්ශනය කිරීම මෙම ආයතනයේ කාර්ය භාරයයි. ඒ අනුව, පසුගිය වර්ෂය තුලදීත් ඉහත සඳහන් පනතෙහි අඩංගු විධිවිධාන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, රජයේ නිලධාරීන්ගේ ක්‍රියාවන් මගින් ඉල්ලුම්කරුවන්ට සිදු වී ඇතැයි කියනු ලබන අයුක්ති සහගත ක්‍රියාවන් හා ලැබී ඇති දෝෂ සහිත තීන්දු, නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලැබීය. එම කාර්යයේදී, සහන ඉල්ලා සිටිමින් අප වෙත යොමු කරනු ලැබූ පැමිණිලි මගින් ඉදිරිපත් කරන ලද, සිදු වී ඇතැයි කියනු ලබන අයුක්තීන් සඳහා පිළියම් යෙදීමට මෙම කාර්යාලය විසින් සෑම ප්‍රයත්නයක්ම දරන ලදී. ගැටලුව මිත්‍රශීලී ලෙස විසඳා ගැනීමට නොහැකි වන කරුණු සම්බන්ධයෙන්, ඒ ඒ අවස්ථාවට අනුකූලව, මෙම කාර්යාලය මගින් නිර්දේශ ලබා දෙනු ලැබීය. ආරවුල් විසඳීමේදී මෙම කාර්යාලය මගින් අදාල නිලධාරීන් වෙත ලිපි යොමු කරමින් සහ දුරකතන මාර්ග ඔස්සේ සම්බන්ධ කර ගනිමින්, එම ආරවුල් කඩිනමින් විසඳා ගැනීමට සෑම උත්සාහයක්ම දරන ලදී. සමාලෝචිත වර්ෂය තුලදී, ලඝු ක්‍රියාමාර්ග තුලින් අවසන් කරන ලද පැමිණිලි හා දෙපාර්ශ්ව කැඳවා විමර්ශනය කරන ලද පැමිණිලි වශයෙන්, සම්පූර්ණ පැමිණිලි 1366ක් සාර්ථකව අවසන් කරන ලදී. පැමිණිලි 828ක කටයුතු අවසන් නොවී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2021 වර්ෂයට යොමු වී ඇත.

ඉල්ලුම්කරුවන් විසින් අප වෙත ප්‍රමාණවත් තොරතුරු සපයා නොමැති වීම, පරීක්ෂණ ආරම්භ කිරීම සඳහා බාධාවක් වන බවද මෙහිදී සඳහන් කල යුතුය. එබඳු අවස්ථාවන්හිදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලෙසට ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමට සිදු වේ. තවද, ඉල්ලීම සිදු කරනු ලබන්නේ කුමන නිලධාරීන්ට එරෙහිවද සහ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතු වූ නිශ්චිත තීරණ මොනවාද යනාදී, අවශ්‍ය තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා විශේෂිත ආකෘති පත්‍රයක් (OMB 01) සියලුම ඉල්ලුම්කරුවන් වෙත, අප විසින් යවනු ලබන අතර, එහි සඳහන් ප්‍රශ්න සඳහා ඔවුන් විසින් පිළිතුරු සැපයීම අවශ්‍ය වේ.

මෙම වර්ෂයේදී ලද පැමිණිලි සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීමේදී, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට එරෙහිව ලැබී ඇති පැමිණිලි ප්‍රමාණය 2019 වර්ෂයට සාපේක්ෂව පැහැදිලි අඩුවක් දක්නට ලැබේ. 2020 වර්ෂයේදී එම අමාත්‍යාංශ විෂය පථයේ සිදු වූ වෙනස්වීම්, මෙලෙස පැමිණිලි අඩුවීමට හේතුවූවා විය හැක. එනම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂයයන්, විෂය පථයන් දෙකකට වෙන් වීමයි. ඒ අනුව, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයට එරෙහිව පැමිණිලි 160ක් ලැබී ඇත. ඒ අතරින්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට එරෙහිව ලැබී ඇති පැමිණිලි වැඩි සංඛ්‍යාවක් ඇත. රජයේ ඉඩම් හා මහවැලි ඉඩම් සඳහා, රජයේ බලපත්‍ර

ලබාගැනීම් හා ඒවායේ අයිතියට අදාලව ලැබුණු පැමිණිලි, පසුගිය අවුරුද්දට සාපේක්ෂව වැඩිවී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව සිදු කරන පැමිණිලි සංඛ්‍යාව ද ඉතා ඉහල මට්ටමක පවතී. ඒ අතුරින් පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීම සම්බන්ධයෙන් පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබී ඇති බව නිරීක්ෂණය වේ. ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ වලදී ලකුණු ලබාදීමේ දෝෂ හා අයදුම්කරුවන්ගේ නිවසේ සිට අයදුම් කරන පාසල අතර දුර ප්‍රමාණයන් තීරණය කරන කවය තුල ඇති පාසල් ප්‍රමාණය සම්බන්ධයෙන් මතුවන ගැටලු මේ සඳහා හේතු වී ඇත.

අනවසර ඉදිකිරීම්, කාණු පද්ධති අවහිර කිරීම්, අනතුරු දායක ගස් කැපීම, අනවසර ගොඩනැගිලි ඉදිකිරීම යනාදී ගැටලු බොහෝමයක් පැමිණිලි ලෙස ලැබෙන අතර, ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් අයත්වන්නේ, ප්‍රාදේශීය සභා / නගර සභා/ මහ නගර සභා ඇතුළු පළාත් පාලන ආයතන වලටය. බොහෝ දුරට එවැනි ගැටලු ද සාර්ථකව විසඳීමට කටයුතු කර ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එරෙහිව ලැබෙන පැමිණිලි සාපේක්ෂව අඩු බවක් පෙන්නුම් කරයි. එම ලැබෙන පැමිණිලි සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව බොහෝ අවස්ථාවලදී කඩිනමින් පිළිතුරු ලබාදෙන අතර, එම හේතුවෙන් පැමිණිලිකරුවන්ගේ ගැටලු සාර්ථකව විසඳීමට හැකියාව ලැබී ඇත. එසේ වුවද පිළිතුරු ලබාගැනීම සඳහා සිහිකැඳවීම් ද යොමු කරන අවස්ථා ද නැත්තේම නොවේ.

පුද්ගලික පාර්ශ්වයන් අතර ඇතිවන, ආරවුල් සහ අධිකරණ හමුවේ විභාග වූ හෝ විභාග වන කරුණු, රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වන පත්කිරීමකට/ මාරු කිරීමට / සේවයෙන් පහ කිරීමට / විනය පාලනයට අදාල පැමිණිලි සහ විගණකාධිපතිවරයාගේ තීරණයකට/ නිර්දේශයකට/ ක්‍රියාවකට හෝ නොකර සිටීමක් යනාදිය ඔම්බුඩ්ස්මන්වරයාගේ බලසීමාවෙන් පරිබාහිර වේ. එවැනි ගැටලු මුල් අවස්ථාවේදීම අප විසින් ප්‍රතික්ෂේප කරනු ලබයි. සඳහන් කළ යුතු තවත් කරුණක් වනුයේ, මෙම කාර්යාලය වෙත ඉල්ලීම් කිරීමේදී, ඒවායින් කිහිපයක් අධික ප්‍රමාදයකින් යුක්තව ඉදිරිපත් කර තිබීමයි. කෙසේ වෙතත්, එවැනි ප්‍රමාදයන්ට හේතු, පැහැදිලිව ඉදිරිපත් කරන්නේ නම් මිස, එම පැමිණිලිද ආරම්භයේදීම ප්‍රතික්ෂේප වීමට, එබඳු ප්‍රමාදයන් හේතු වනවා ඇත.

පැමිණිලිවලට අදාල ආයතන වල රජයේ නිලධාරීන් විසින් අප වෙත එවිය යුතු වාර්තා ලබාදීමේදී සිදුවන ප්‍රමාදය හා ගැටලු නිරාකරණය සඳහා වන ඔවුන්ගේ උදාසීනත්වය සහ අප විසින් අසනු ලබන ප්‍රශ්ණ වලට ඔවුන් විසින් පිළිතුරු දීමට දක්වන මැලිකම යනාදී කරුණු හේතුවෙන් ගැටලු නිරාකරණය කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවී ඇති බවද සඳහන් කළයුතුය.

මෙම කාර්යාලය මඟින් පවත්වනු ලබන පරීක්ෂණයකදී හෝ විමර්ශනයකදී අනුගමනය කරනු ලබන යුක්ති යුක්තභාවය පිළිබඳ අවබෝධ කර ගැනීමට ඉහල මට්ටමේ නිලධාරීන් පවා නිසි සැලකිල්ලක් යොමු නොකර අභියෝගයට ලක්ව ඇති තීරණ හෝ ක්‍රියාමාර්ග සාධාරණීයකරණය කිරීම සඳහා සමහරක් නිලධාරීන් තම කාලය සහ ශ්‍රමය වැය කරන බවක් ද පෙනී යයි. සිදු කළ වරදේ බරපතලකම සහ පුරවැසියන් වෙත එමගින් සිදු වන හානිය පවා නොසලකමින්, තවත් නිලධාරින් කොටසක්, දිගින් දිගටම එවැනිම වැරදි ක්‍රියාමාර්ග හා සාවද්‍ය තීරණ ගැනීමෙහි නිරතව සිටින බවද පෙනි යන කරුණකි. එබඳු ක්‍රියා කලාපයන් මගින් පාලන තන්ත්‍රයේ වැඩි දියුණුවක් සිදු නොවන අතර, අනෙක් අතට එය මුළු පරිපාලන ක්‍රමයම දූෂිතවීමක් විමට ඉඩඇති බවද සඳහන් කළ යුතුය. තවද, සාධාරණ පැමිණිලි ඉදිරිපත් කරන පුරවැසියන් පිළිගැනීමට සහ ඔවුනට ඇහුම්කන් දීමට රජයේ නිලධාරීන් සූදානම් නොමැති නම් එය රටේ පරිපාලනය දුර්වල කිරීමට හේතුවනවා නිසැකය.

මෙම වර්ෂයේදී කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය රටතුල පැවතියද, අපගේ කාර්යාලීය කටයුතු ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යන ලදී. රට තුල පනවා තිබුණු ඇඳිරිනීතිය හේතුවෙන් අප්‍රේල් මාසයේදී පමණක් කාර්යාල වසා තිබුණු අතර, එම හේතුවෙන් අදාළ පාර්ශව කැඳවා පවත්වනු ලබන පරීක්ෂණද කල්දමන ලදී. මේ වන විට එම කටයුතු සුපුරුදු පරිදි සිදුකරනු ලබයි.

## *2.1.2 යෝජනා*

**පරිපාලනමය වශයෙන් ගෙන ඇති දෝෂ සහිත තීරණ නිවැරදිකර ගැනීමට, මෙම කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු ආශ්‍රයෙන් ඉදිරිපත් කළ හැකි යෝජනා**

අංක OMB/P/2/2/3517/2019 දරණ මෙම ලිපිගොනුවෙන් ඉදිරිපත් වන ගැටලුව වන්නේ, වසර 38කට වැඩි කාලයක් සංවර්ධනය කළ ඉඩමක අයිතිවාසිකම් අහිමිවීමකි.

ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ එල්.එල්. 55551 බලපත්‍රයට අදාල ඉඩම, මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන පී.එච්.සිරියාවතී මියගේ මවට බලපත්‍රයක් මඟින් ලබා දී ඇත. ඇය ජීවත්ව සිටියදී එහි පසු අයිතිය පැමිණිලිකාරියගේ වැඩිමල් සහෝදරයා වෙත පවරමින්, ඒ සඳහා ඔහුව නම් කර ඇත. සිරියාවතී මහත්මියගේ මව හා පියා මිය ගොස් ඇත. වැඩිමල් සහෝදරයා වසර 20කට අධික කාලයක් මහවැලි ඉඩම්වල ස්ථිරව පදිංචිව සිට 2019 වසරේදී මිය ගොස් ඇත. ඔහු මහවැලි ඉඩම්වල පදිංචි වීමටත් පෙර සිටම පැමිණිලිකාර සිරියාවතී මහත්මිය විසින් මෙම ඉඩම සංවර්ධනය කරමින් වැඩි දියුණු කරමින් හා භුක්තිය පවත්වාගෙන යමින්, රැක බලා ගෙන ඇති බව පැමිණිල්ලේ සඳහන් වේ.

වැඩිමහල් සහෝදරයා මිය යාමෙන් පසු, ඔහුගේ බිරිඳ විසින් කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් වෙතින් මෙම ඉඩමේ අයිතිවාසිකම් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් විසින් 2019.10.09 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී, ඉඩමට අයිතිවාසිකම් ඉදිරිපත් කරන සියලු පාර්ශව කැඳවා, පරීක්ෂණයක් පවත්වා ඇත. එහිදී සිරියාවති මියගේ වැඩිමල් සහෝදරයාගේ බිරිඳ වෙත ඉඩමේ ජීවිත භුක්තිය ලබා දීමට තීරණය වී ඇත. එහිදී එම තැනැත්තිය විසින් සිරියාවති මහත්මිය භුක්ති විඳින ඉඩමේ කොටසක් පමණක් ඇයට ලබා දීමට එකඟ වී ඇත.

එම තීරණය හේතුවෙන් පී.එච්.සිරියාවති මහත්මියට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරන ලදී. එසේ නිරීක්ෂණය කරන ලද්දේ, පැමිණිලිකාරිය විසින් වසර 38කට වැඩි කාලයක් සංවර්ධනය කළ, වැඩි දියුණු කළ ඉඩම, ඇයට අහිමි වී යාම හේතුවෙනි. කෙසේ වෙතත්, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් විසින් ගෙන ඇති තීරණය ඉඩම් සංවර්ධන ආඥා පනතේ සඳහන් නීතියට අනුකූල නොවී ගෙන ඇති තීරණයක් නොවන බවද සඳහන් කල යුතුය. එහෙත්, පොදු නීතියේ සංකල්පයක් ලෙස පවතින, කිසියම් අයෙකු විසින් සිදු කර ඇති වැඩි දියුණු කිරීම්, සංවර්ධනය කිරීම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඒ සඳහා ප්‍රතිකර්ම ලබාදිය යුතුය යන කරුණට කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම්ගේ අවධානය යොමු නොවූ බවද මෙහිදී සඳහන් කළ යුතුය.

එවැනි පසුබිමක් යටතේ, මෙවැනි ගැටලු ඉදිරියේදී ඇතිවීම වළක්වා ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

I. ඉඩම් සංවර්ධන ආඥා පනතේ පවතින ඇතැම් නීති, කාලානුරූපීව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. ඒ තුළින් මෙවැනි ගැටලු ඇතිවීම අවම කර ගත හැකිවේ.

II. රජයේ ඉඩමක අයිතිය පැවරීමේදී එම ඉඩම භුක්ති විඳිමින්, දීර්ඝ කාලයක් සංවර්ධනය කළ අයවලුන් වෙත, අයිතිවාසිකම් හිමිවන ආකාරයට ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම.

III. රජයේ ඉඩමක් සඳහා වන බලපත්‍ර ලාභියෙකු මියයාමෙන් පසුව, එකී මියගිය තැනැත්තා නමින් නිකුත්කර ඇති බලපත්‍රයට අදාල ඉඩමේ අයිතිවාසිකම කුමන පුද්ගලයෙකුට අනුප්‍රාප්ත වියයුතුද යන කරුණ සම්බන්ධයෙන් කිසියම් ව්‍යාකූල තත්ත්වයක් පැන නැඟී ඇති බවට ඉදිරිපත් වී ඇති පැමිණිලි වලින් පැහැදිලි විය. එම කරුණට විශේෂ අවධානය යොමුකර ඉඩම් සංවර්ධන ආඥා පනත සුදුසු පරිදි සංශෝධනය කළ යුතුය.

අංක OMB/P/2/2/3127 දරණ මෙම ලිපිගොනුවට අදාළ ගැටලුව වන්නේ, පැමිණිලිකාර කේ.සිරියාවති මහත්මියගේ සැමියාගේ මරණින් පසු, එකී සැමියාට පසු අයිතිය හිමිකරමින් පැවරුන ඉඩමේ අයිතිය, ඇය වෙත නොලැබී යාමයි.

මෙම ගැටළුවට අදාල ඉඩම අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රජයේ ඉඩමකි. ඒ සඳහා LL 190 දරණ බලපත්‍රය පැමිණිලිකාරිය වන කේ.සිරියාවති මහත්මියගේ මියගිය සැමියාගේ පියා වෙත ලබා දී ඇත. සැමියාගේ පියා 1981 වසරේ දී මියගොස් ඇත. පසු අයිතිය නම් කළ පැමිණිලිකාරියගේ සැමියා, 1983 වසරේ දී මියගොස් ඇත. පසුව මෙම ඉඩමට අයිතිකරුවෙකු සොයා ගත නොහැකි වීම මත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 85 වන වගන්තිය ප්‍රකාරව එය රජයට පවරා ගෙන ඇත.

එය එසේ වුවත්, පසු අවස්ථාවකදී කේ.සිරියාවති මහත්මිය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ඉඩමේ අයිතිය ඉල්ලා ඇත. එම අවස්ථාව වන විට අනවසර පුද්ගලයෙකු විසින් මෙම ඉඩම භුක්ති විඳින බව දැන ගැනීමට ලැබී ඇත. එම අනවසරකරු ඉවත් කිරීම සඳහා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් විසින්, රජයේ සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ විධිවිධානයන් යටතේ මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා, නෙරපීමේ නියෝග ලබාගෙන තිබුණද, එම නඩු තීන්දුව විධිමත්ව ක්‍රියාත්මක කර නොගැනීම හේතුවෙන්, අනවසර පදිංචිකරු ඉවත් කර නොමැත. පසු අවස්ථාවකදී, බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් විසින්, සිරියාවති මහත්මිය නමින් බලපත්‍රයක් ලබාදෙන ලෙස, ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. ඒ අනුව, ඉඩමේ අදාළ මැනුම් කටයුතු සිදු කර ඇත. කෙසේ වෙතත්, අනවසර පදිංචිකරු ඉවත් නොවීම නිසා, ඇති වී තිබූ ආරවුල් තත්ත්වය මත බලපත්‍රයක් ලබානොදී, ඒ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා යැවීමට ප්‍රාදේශීය ලේකම් (අගලවත්ත) කටයුතු කර ඇත. මතුගම උසාවියේ පැවති, අනවසර පදිංචිකරු නෙරපීමේ නඩුවේ, නඩු වාර්තාව අස්ථාන ගත වීම නිසා, නීතිපතිතුමා විසින්ද ඉල්ලා තිබූ උපදෙස් ලබා දී නොමැත. මෙම තත්ත්වය මත කේ.සිරියාවති මහත්මියට ඉඩමේ අයිතිය අහිමි වී ඇත. අනවසරකරු තවදුරටත් ඉඩම භුක්ති විඳිමින් සිටී.

මෙවැනි ගැටළු ඇති වීම වළක්වා ගැනිමට ඉදිරිපත් කළ හැකි යෝජනා:

I. කිසියම් කරුණක් සම්බන්ධයෙන්, උසාවි නියෝග ලබා දී තිබූ අවස්ථාවන්හිදී, පිස්කල් නිලධාරීන්ගේ සහයෝගය ලබාගෙන අනවසර පදිංචිකරු ඉවත්කිරීමේ හැකියාවක් අගලවත්ත ප්‍රාදේශීය ලේකම් වෙත තිබුණද, එය ක්‍රියාත්මක කර නොගැනීම, අදාළ නිලධාරීන්ගේ පරිපාලන දුර්වලතාවයකි. එවැනි දුර්වලතා මඟ හැර, නිලධාරීන් කටයුතු කලයුතු බව තහවුරු කළ යුතුය.

II. රජයේ සියලුම ආයතනවල ලිපිගොනු, වාර්තා, ලේඛන ආදිය, ලේඛනාගාරයට හෝ ඉන් පිටතට යොමු කිරීමේදී, ඒ සඳහා විධිමත් පිළිවෙතක් සකස්කර, ලේඛනවල අවශ්‍ය වැදගත් තොරතුරු ද ලේඛන ගතකර, එම ලේඛන වගකිව යුතු නිලධාරියෙකු භාරයේ පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය.

අංක OMB/P/2/4/4552 දරණ ලිපිගොනුවෙන් ඉදිරිපත් වන ඉල්ලීම වන්නේ, පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයෙහි, සංවර්ධන සහකාරවරියක ලෙස සේවය කරනු ලබන එම්.ඒ.බී.ඒ.සඳමාලි මියට හිමිවිය යුතු සංවර්ධන නිලධාරී සේවයට ඇයව අන්තර්ග්‍රහණය කර, II ශ්‍රේණියට උසස් කර දෙන ලෙසයි.

ඉල්ලුම්කාරිය 2005.08.22 දින තැපැල් දෙපාර්තමේන්තුවේ සංවර්ධන සහකාර පත්වීමක් ලබා ඇති අතර, 2016.06.20 දිනැතිව වයඹ පළාත් සභාවට අන්තර්ග්‍රහණය වී පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයෙහි සේවයට වාර්තා කර ඇත. අනතුරුව ඇයට 2015.08.22 දිනට II ශ්‍රේණියට උසස්වීම ලැබිය යුතු බැවින්, ඒ සඳහා වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇතත්, එයට, අවශ්‍ය සේවා කාලය අයත් වන්නේ මධ්‍යම රජයට බව දන්වමින්, පළාත් සභාව විසින් එම ඉල්ලීම ඉටුකළ නොහැකි බවට දන්වා ඇත. පසුව ඉල්ලුම්කාරිය විසින් තමාහට II ශ්‍රේණියට උසස්වීම ලබාදෙන ලෙසත් සහ ඇයව සංවර්ධන සේවයට අන්තර්ග්‍රහණය කර දෙන ලෙසත් තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. එය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු වීමෙන් පසුවද අදාළ අන්තර්ග්‍රහණය හා උසස්වීම ලැබී නොමැත.

මවිසින් මේ සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙතින් විමසීම් කළ අතර, ඉන් අනතුරුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ, තැපැල් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) යන නිලධාරීන්ගේ හා ඉල්ලුම්කාරියගේ සහභාගීත්වයෙන් යුක්තව මෙම කාර්යාලයේදී පරීක්ෂණයක්ද පවත්වන ලදී. එහිදී ඉල්ලුම්කාරිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2012 අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බැවින් හා II ශ්‍රේණියට උසස්වීම ලැබීමට අවශ්‍ය වසර 10 ක සේවා කාලය සපුරා ඇති බැවින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් මේ පිළිබඳව විමසීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍ය වූ අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂම වෙතින් ලද අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් එම අනුමැතිය මත කටයුතු කර, ඉල්ලුම්කාරියගේ ගැටලුව නිරාකරණය කරන ලදි.

මෙවැනි ගැටලු ඇතිවීම වැළැක්වීම සඳහා

I. රාජ්‍ය ආයතන නිසි සම්බන්ධීකරණයකින් යුතුව හා අප්‍රමාදව කටයුතු කළ යුතුය
II. සිය පත්වීම හා උසස්වීම් සම්බන්ධයෙන් ඉල්ලීම් සිදු කිරිමේදී, එසේ ඉල්ලුම් කරන රාජ්‍ය නිලධාරීන්ද, ඒවා ප්‍රමාදයකින් තොරව ඉටුකළ යුතුය.

OMB/P/2/7/822, OMB/P/2/7/826, OMB/P/2/7/829, OMB/P/2/7/831, OMB/P/2/7/832, OMB/P/2/7/839, OMB/P/2/7/861, OMB/P/2/7/882, OMB/P/2/7/912, අංක දරණ ලිපිගොනු මඟින් ඉදිරිපත් වී ඇති ගැටලුව වන්නේ, ඒවායෙහි පැමිණිලිකරුවන් ඔවුන් වයස අවුරුදු 45 ලඟා වීමට පෙර, අනියම්/ ආදේශක/ තාවකාලික/ දෛනික පදනම මත පත්වීම් ලබා ඇති නමුත්, ඔවුන් සේවයේ ස්ථිර කිරීමේදී රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව වන වයස අවුරුදු 45 ඉක්මවා ඇති බැවින්, විශ්‍රාමෙ වැටුප ඔවුන්ට අහිමිවී යාමයි.

එසේ ස්ථිර පත්වීම් ලබා දිමේදි එම පත්වීම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය යන පදනම මත ලබා දී ඇත. නමුත් නිලධාරියා වයස අවුරුදු 60 සපුරා විශ්‍රාම යැමේදී අදාළ අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් පසු, එම නිලධාරියාගේ පත්වීම, ස්ථිරත්වයට පත්ව ඇත්තේ වයස අවුරුදු 45 ඉක්මවා යාමෙන් පසුව බැවින්, පවතින රෙගුලාසි වලට අනුකූලව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමේ හැකියාවක් නොමැති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පවසා ඇත.

නමුත් මේ සම්බන්ධයෙන් ඔවුන් තම දුක්ගැනවිල්ල අප වෙත ඉදිරිපත් කල ද, පවතින නීතීමය රාමුවෙන් පිටතට පැමිණ ඔවුන් වෙත සාධාරණයක් ඉටුකිරීමේ හැකියාවක් අප වෙත නොමැත. එබැවින්, එවැනි ගැටලු මඟහරවා ගැනීම සඳහා රාජ්‍ය සේවයට වයස අවරුදු 45 සිමාව ඉක්මවා පත්වීම් ලබාදීමේ දී, ක්‍රියාකල යුතු ආකාරය තීරණය කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කරමි.

අවසාන වශයෙන් සඳහන් කළයුතු යෝජනාවක් ලෙස ඉදිරිපත් කල හැක්කේ, රාජ්‍ය සහ වෙනත් ඒ හා සමාන ආයතනවල නිලධාරීන් විසින් සිදු කරනු ලබන වැරදි ක්‍රියා සහ ගනු ලබන වැරදි තීරණ සඳහා ඔවුන්ට සුදුසු දඬුවම් ලබා දීමට හැකි වන පරිදි නියෝග නිකුත් කර, ඒ අනුව චක්‍රලේඛ නිකුත් කිරීමයි. එම යෝජනාව තීරණ ගන්නා නිලධාරීන් සම්බන්ධයෙන් සලකා බලන විට දැඩි තීරණයක් වුවද, ඒ මඟින් යහපත් ප්‍රතිඵල ළගාකර ගැනීමට හැකිවනවා ඇත.